**නවගත්තේගම ප්‍රාදේශීය සභාව - 2023**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | වත්කමේ ප්‍රත්‍යාගණන අගයට ගිණුම්ගත කිරීමේදී එකම පන්තියකට අයත් සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කොට එම අගයට සියළු වත්කම් ගිණුම්ගත කළ යුතු වුවත් නව වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල පමණක් රු.8,450,000කට ප්‍රත්‍යාගණනය කොට එම අගය ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව. | වත්කම් ප්‍රත්‍යාගණනය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දේපළ පිරියත හා උපකරණ ශේෂයත් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂයත් සමාන විය යුතු වුවත් 2023 දෙසැම්බර් 31 දිනට රු.7,525,121ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මු.රෙ. 103(1)(අ),(ආ),(එ) (එ) හා 104(4) | සභාවට අයත් කැබ් රථයක් 2021 අගෝස්තු 20 දින අනතුරකට භාජනය වී තිබූ අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව. | මූල්‍ය රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2013 අංක 01 දරණ ප්‍රජාමූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය | බල ප්‍රදේශයේ ස්ථාපිත ප්‍රජාමූල සංවිධාන අතරින් 14ක් වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකයේ ලියාපදිංචි කරවීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ප්‍රජා මූල සංවිධාන අධීක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,911,507ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,267,997ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 1,309 | 1,347 | 1,129 | 144 | 1,284 | 1,255 | 1,129 | 164 |
| කුලී | 8,361 | 3,151 | 2,984 | 209 | 6,192 | 2,845 | 2,813 | 73 |
| බලපත්‍ර ගාස්තු | 193 | 233 | 233 | - | 194 | 159 | 159 | - |
| වෙනත් ආදායම් | 2,640 | 1,919 | 1,700 | 229 | 876 | 686 | 666 | 31 |
| එකතුව | 12,503 | 6,650 | 6,046 | 582 | 8,546 | 4,945 | 4,767 | 268 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් ලැබිය යුතු උසාවි දඩ රු.1,333,666ක් හා මුද්දර ගාස්තු රු.567,020ක් විය. | හිඟ මුදල් ලබා ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම්වල වටිනාකම රු.9,689,631ක් වූ අතර එය තුල වර්ෂ 03ක් ඉක්ම වූ ශේෂවල වටිනාකම රු.1,047,632ක් විය. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.9,745,842ක් වූ අතර එය තුල වර්ෂ 03ක් ඉක්ම වූ ශේෂවල වටිනාකම රු.1,921,505ක් විය. | හිඟ මුදල් පියවීමට කටයුතු කරන බව. | ණයහිමි ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ගොඩනැගිලි පිහිටි ඉඩම් හා සභාව විසින් භුක්ති විඳින, පාලනය හා නඩත්තු කෙරෙන සුසාන භූමි 14ක නිත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හැකි ඉක්මනින් එම ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | අදාළ දේපළවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන 1992 වර්ෂයේ දී ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ලබා දී තිබූ කැබ් රථය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේ ලබාදුන් රු.14,000,000ක් වටිනා ජල බවුසරයෙහි අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතරම ජල බවුසරය ප්‍රයෝජනයට ගෙනද නොතිබුණි. | ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරන බව. | අදාළ රථවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඇ) | වටිනාකම්හි එකතුව රු.95,000ක් වූ වත්කම් 02ක් වර්ෂ ගණනාවක සිට භාවිතා නොකර නිශ්ක්‍රීයව පැවතුණි. | ඉදිරියේදී මේ පිළිබඳව කටයුතු කරන බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2017 වර්ෂයේදී පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ රු.12,977,976ක් වැයකර නවගත්තේගම බස්නැවතුම්පළ ගොඩනැගිල්ල ඉදිකර තිබූ අතර එහි උඩුමහළ ඉදිකර වසර 06කට ආසන්න කාලයක් භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කරන බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2020 වර්ෂයේදී රු.175,000ක් වැයකර නිම කරන ලද ජංගම මාළු වෙළඳ කුටිය 2022 වර්ෂයේ සිට බදුදීමට කටයුතු නොකිරීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි. | 2024 වර්ෂයේ බදු දී ඇති බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |
| (ඊ) | 2019 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ගෙදරවැව ස්වශක්ති ක්‍රීඩා සමාජයට අයත් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා රු.942,053ක් වැයකර තිබූ අතර භෞතික පරීක්ෂාවේදී ක්‍රීඩාපිටිය කැළෑවෙන් වැසී තිබූ බව දක්නට ලැබුණි. | ක්‍රීඩා තරඟ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |
| (උ) | ගෙදරවැව වොලිබෝල් ක්‍රීඩාපිටිය සෑදීම සඳහා ව්‍යාපෘතියේ අවසාන ගෙවීම් වාර්තාව අනුව 05 වන වැඩ විෂයය යටතේ වොලිබෝල් කෝඩ් (Volleyball Coard) එකක් සෑදීම සඳහා රු.31,336ක් ගෙවීම්කර තිබුණද භෞතික පරීක්ෂාවේදී එම වොලිබෝල් කෝඩ් එක දක්නට නොතිබුණි. | ක්‍රීඩා සමාජය මඟින් සිදු වූ වරද නිවැරදි කර ඇති බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |
| (ඌ) | ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම 2021 යටතේ රු.1,470,000ක් වැයකර නිම කරන ලද කැලේවැව ක්‍රීඩාපිටිය භාවිතා නොකිරීම හේතුවෙන් කැළෑවෙන් වැසී තිබූ බව දක්නට ලැබුණි. | මේවන විට පසුගිය නිවාසාන්තර ක්‍රීඩා උත්සවයට සමගාමීව අදාළ ක්‍රීඩාපිටිය ශුද්ධ පවිත්‍ර කර භාවිතා කරන ලද බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |
| (එ) | කසළ අංගනය ඉදිකිරීම සඳහා රු.17,535,238ක් වැයකර තිබුණ ද වල් අලි තර්ජන හේතුවෙන් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | කොම්පෝස්ට් පොහොර සකස් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද හා මිලදී ගන්නා ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | කසළ අංගනය සඳහා ලබාගන්නා ලද වතුර ටැංකිය බහුකාර්යය ගොඩනැගිල්ල සහිත පරිශ්‍රයේත්, හලර් යන්ත්‍රය සහා භූමියේත් නිශ්කාර්යව පැවතුණි. | එම | එම |
| (ඔ) | 2022 වර්ෂයේ ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ රු.1,006,831ක් වැයකර තම්මැන්නාවැටිය විහාරස්ථානය ඉදිරිපිට ඉදිකරන ලද ශරීර සුවතා මංතීරුව ප්‍රදේශවාසීන් විසින් භාවිතයට නොගැනීම හේතුවෙන් කැළෑවෙන් වැසී තිබුණි. | මංතීරුව කඩිනමින් ජනතාවට භාවිතා කිරීමට වැඩපිළිවෙළක් සකස් කරන බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ පරීක්ෂාවේදී තෘතීයික තනතුරක් වන ලේකම් තනතුර සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ප්‍රාථමික හා ද්විතියික තනතුරුවලට අදාළව පුරප්පාඩු 09ක් හා අතිරික්තතා 17ක් පැවතුණි. | අතිරික්ත හා පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | සභාවට අවශ්‍ය සේවක සංඛ්‍යාව නිවැරදිව හඳුනාගෙන අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 වාෂර්ක ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 09ක් ඉටු කිරීම සඳහා රු.180,643ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | 2024 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2023 ජනවාරි සිට ජූනි දක්වා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ අතර ජූලි සිට සැප්තැම්බර් දක්වා සභාවේ අභ්‍යන්තර විගණනය විසින් අවධානය යොමු කර තිබුණේ පැමිණීම, නිවාඩු, ආදායම් රැස් කිරීම, මාසික ධාවන සටහන් හා බැංකු ගිණුම් පරීක්ෂාව පිළිබඳව පමණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය හා මු.රෙ. 133(1) අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | ආයතනයේ සියළුම කටයුතු ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. |

**4.3** අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | පිළියෙල කර තිබූ අයවැය අනුව වැය විෂයයන් 23ක් සඳහා සලසා ගෙන තිබුණු රු.1,641,680ක ප්‍රතිපාදනය මුළුමනින්ම ඉතිරි වී තිබුණි. | ඉදිරියේදි තාත්ත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙළ කර වැය විෂයන් සඳහා අදාල වැඩසටහන් කිරිමට අවශ්‍ය කටයුතු කරන බව. එම | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |
| (ආ) | තාත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 20ක් සඳහා සලසාගෙන තිබුණු රු. 4,072,250ක් වූ ප්‍රතිපාදිත මුදලින් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |

**4.4** තිරසාර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී නිරෝගීමත් ජීවිතයක් හා සහජීවනය සහතික කිරීම, යටිතල පහසුකම් ගොඩ නැඟීම, තිරසර බලශක්ති භාවිතය, අධ්‍යාපනයේ සමානාත්මතාවය හා නියත දරිද්‍රතාවය පිටු දැකීම යන තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා හඳුනාගත් ක්‍රියාකාරකම් 09ක ප්‍රගතිය කරා ළගා නොවීම සියයට 2.6 සිට සියයට 84 දක්වා පරාසයක පැවතුණි. | 2024 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට අනුව තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කරන බව. | අරමුණු හා ඉලක්ක නිසි පරිදි හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය |